ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2007/2008

පරිසර නීතිය - **LWU 3314/4334**

කාලය - විනාඩි 40

---

දිනය - 2007.12.14 වේලාව - පෙ.ව. 10.00.- පෙ.ව. 10.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "පරිසරය මත දැඩි අහිතකර බලපෑම් උද්ගත කරනු ලැබිය හැකි සහ ජාතික මට්ටමේ අධිකාරී ආයතනයක තීරණයකට යටත්වන ආකාරයෙහි, ජාතික මට්ටමේ මෙවලමක් ලෙස, යෝජිත ක්‍රියාකාරකම් සඳහා, පරිසර බලපෑම් තක්සේරුව ක්‍රියාවේ යෙදවිය යුතුය."

[(1992) රියෝ ප්‍රකාශයෙහි 17 වන මූලධර්මය]

ජාතික මෙවලමක් ලෙස පරිසර බලපෑම් තක්සේරුව කොතෙක්දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න විවේචනාත්මකව පැහැදිලි කරන්න.

02. එක්ස්ටා හා වීටා යනු ග්‍රිනීටා රාජ්‍යයෙහි ප්‍රබල වාණිජ නගර දෙකකි. මෙම නගර දෙක අතර පරතරය කිලෝමීටර 60 කි. මෙම එක්ස්ටා හා වීටා නගර දෙක සම්බන්ධ කරමින් අධිවේගී මාර්ගයක් ඉදිකිරීමට ග්‍රිනීටා රාජ්‍යයෙහි මහාමාර්ග අමාත්‍යාංශය තීරණය කර තිබේ. ජාවා රාජ්‍යය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර ලබාදීමට කැමැත්ත පළකර තිබේ. මෙම ව්‍යාපෘතියේ බලපෑමට යටත්වන ප්‍රදේශය තුල ජනතාව විශාල ප්‍රමාණයක් ජීවත් වේ. මෙම ව්‍යාවෘතිය සඳහා පරිසර බලපෑම් තක්සේරුවක් සිදුකර නැත.

මෙම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන පීටර් රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් නරඹමින් සිටියදී මසක් තුලදී එහි ඉදිකිරීම් ආරම්භ වන බව දැනගනී. යෝජිත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මඟින් ඔහුගේ ප්‍රදේශයට බලපාන බව වටහා ගන්නා පීටර් මේ සම්බන්ධ නඩු කටයුතු සඳහා ඔබගෙන් නීතිමය උපදෙස් බලාපොරොත්තු වේ.

ග්‍රිනීටා රාජ්‍යයේ නීතිය ශ්‍රී ලංකාවේ නීති තත්වය හා සමානයැයි උපකල්පනය කරමින් පීටර්ට උපදෙස් දෙන්න.

\- හිමිකම් ඇවිරිණි. -